# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1801/28 - 2013 මාර්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2013.03.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 34 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් කරනු ලබන නිවේදනයයි.

නිවේදනයයි

**මසුන් ඇල්ලීම සඳහා තහනම් කාල සීමා නිවේදනය කිරීම**

අංක 1784/4 සහ 2012.11.12 වන දින ප්‍රකාශයට පත් කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත උපලේඛනයේ දැක්වෙන අක්ෂාංශ සහ දේශාංෂ වලින් විස්තර වන සටහන සහ සිතියමේ දැක්වෙන ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයට අදාළ මුහුදු තීරයේ මසුන් ඇල්ලීම තහනම් කිරීමේ කාල සීමාව 2013 වර්ෂයේ මාර්තු මස 31 දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 13 වැනි දින,
මාලිගාවත්ත,
කොළඹ 10,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

03 - 1118

1A - PG 001582— 835 (2013/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*